# කාර්ය සාධන වාර්තාව
# 2018

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

# පටුන


දැක්ම ........ v

මෙහෙවර ........ v

1. අරමුණු ........ 1

2. විධායක සාරාංශය ........ 1

3. සමස්ථ විග්‍රහය ........ 4

4. මූල්‍ය කාර්යක්ෂමතාවය ........ 6

5. මෙහෙයුම් කාර්යක්ෂමතාව ........ 9

6. ධාවන බල සැපයුම සහ දුම්රිය ඇණිය ........ 14

7. ස්ථිර මාර්ග පද්ධතිය හා ඉදිකිරීම් ........ 16

8. සංඥා හා විදුලි සංදේශ පද්ධතිය ........ 19

9. ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ........ 20

10. දුම්රිය ආරක්ෂක සේවය ........ 20

11. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ගත් පියවර ........ 21

12. අභියෝගයන් සහ ගැටලු ........ 22

13. 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රාග්ධන ක්‍රියාකාරකම් ........ 23

14. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති ........ 24

## දැක්ම

දකුණු ආසියාවේ වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම.

## මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායී, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම.

## 1. අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- කළමනාකරණ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

**සේවාවන්**

- ➢ තදාසන්න, සීඝ්‍රගාමී හා නගරාන්තර දුම්රිය සේවා
- ➢ කාර්යාල දුම්රිය සේවා
- ➢ භාණ්ඩ ප්‍රවාහන සේවා
- ➢ සංචාරක දුම්රිය සේවා
- ➢ ජංගම දුරකථන මඟින් ආසන වෙන් කිරීමේ පහසුකම්
- ➢ ආගමික කටයුතු වෙනුවෙන් විශේෂ දුම්රිය සේවා
- ➢ වන්දනාකරුවන් වෙනුවෙන් විශ්‍රාම ශාලා පවත්වා ගෙන යෑම
- ➢ දුම්රිය ස්ථානයන්හි (තෝරා ගත්) නවාතැන් පහසුකම් ලබා දීම
- ➢ මගීන් සඳහා භෝජන ශාලා හා සේවා මධ්‍ය ස්ථාන පවත්වා ගෙන යෑම

## 2. විධායක සාරාංශය

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් කරුවෙකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2018 වර්ෂයේදී ද සමස්ථ ආර්ථික වර්ධනයට දායක වෙමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. 2018 වර්ෂයේදී මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල වර්ධනයක් පෙන්නුම් කරමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්කාරී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ඉහළ කැප වීමකින් කටයුතු කරනු ලැබීය. මෙම වර්ෂයේ දුම්රිය වෘත්තීය සංගම් මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩ වර්ජන කීපයක් හේතුවෙන් මගී හා භාණ්ඩ දුම්රිය මෙහෙයුම් කටයුතු වලදී යම් බාධාවන්ට මුහුණ පෑමට සිදු විය. එය මගී ආදායම හා භාණ්ඩ ප්‍රවාහන ආදායම අඩු වීම කෙරෙහි බලපෑමක් එල්ල වුවද සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි විය.

මෙම වර්ෂයේදී මගී ප්‍රවාහන සේවා පුළුල් කරමින් පහත පරිදි මගී දුම්රිය සේවා කීපයක් හදුන්වා දීමට හැකි වූ අතර ඒ තුළින් දුම්රිය කෙරෙහි යම් මගී ආකර්ෂණයක් ලබා ගැනීමට හැකි වුණි.

- සෙනසුරාදා දිනවල හික්කඩුව සිට මරදාන බලා ධාවනය වූ දුම්රිය ගාල්ල දක්වාත්, මරදානේ සිට ගාල්ල දක්වා ධාවනය වූ දුම්රිය මාතර දක්වාත්, ඉරිදා දිනවල ගාල්ලේ සිට මරදාන දක්වා ධාවනය වූ දුම්රිය මාතර සිට ගමන් ආරම්භ කරන ලදි.
- මහනුවර - ඇල්ල සති අන්ත නව දුම්රිය සේවයක් ආරම්භ කිරීම
- මගී සුව පහසුව ඇති කිරීම සඳහා දිනපතා සවස වේයන්ගොඩ දක්වා ධාවනය වූ දුම්රිය මීරිගම දක්වා දීර්ඝ කිරීම
- දිනපතා උදය වරුවේ මොරටුව දක්වා ධාවනය කරන ලද දුම්රිය පානදුර දක්වා දීර්ඝ කිරීම

භාණ්ඩ ප්‍රවාහන කටයුතු තව දුරටත් වර්ධනය කරමින් සිමෙන්ති ප්‍රවාහන කටයුතු හා ඛණිජ තෙල් ප්‍රවාහන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකි විය. තවද ප්‍රීමා නිෂ්පාදන ප්‍රවාහනය සඳහා Brake van 06 ක් හා කන්ටේනර් වැගන් 15 ක් ගෙන්වීමට අවශ්‍ය මූලික කටයුතු සියල්ල සූදානම් කර ඇති අතර ඉදිරියේදී ණයවර ලිපි නිකුත් කිරීම සිදුකරනු ලැබේ.

**නව ව්‍යාපෘති**

2018 වර්ෂයේදී ද නව ව්‍යාපෘති කීපයක කටයුතු ආරම්භ කළ අතර ආරම්භ කරන ලද ව්‍යාපෘති කීපයක කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි.

01. **දුම්රිය ඇණිය මිල දී ගැනීමේ ව්‍යාපෘතිය**

(i) ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය එන්ජින් 10 ක්, බලවේග කට්ටල 06 ක් මගී මැදිරි 160 ක් තෙල් ටැංකි 30 ක් හා කන්ටේනර් වැගන් 20 ක් මිල දී ගැනීම සඳහා 2016 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවා මූලික ඇගයීම් කටයුතු සිදු කරනු ලැබීය. 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ප්‍රථම බලවේග කට්ටල හා එන්ජිම ලංකාවට ගෙන එන ලදී.

(ii) උඩරට දුම්රිය මාර්ගය සඳහා දුම්රිය එන්ජින් 12 ක් හා බලවේග කට්ටල 09 ක් සඳහා මිල ගණන් කැඳවා ඇගයීම් කටයුතු ආරම්භ කරනු ලැබීය.

01. **ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200 ක් ස්ථාපනය කිරීම.**

මේ යටතේ ප්‍රමුඛතාව අනුව හඳුනා ගත් දුම්රිය ස්ථාන සඳහා දුම්රිය හරස් මාර්ග ස්ථාපිත කිරීම ආරම්භ කළ අතර 2018 වර්ෂය අවසන් වන විට හරස් මාර්ග 85 ක් ස්ථාපිත කර අවසන් කර ඇත.

02. **මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම**

මෙම ව්‍යාපෘතිය බාහිර සමාගමක් සමඟ ඇති කර ගත් ගිවිසුමක් අනුව ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ මගී පහසුකම් වැඩි කිරීම හා සේවා පුළුල් කිරීම සඳහා මගී මැදිරි සංඛ්‍යාව වැඩි කිරීමයි. මේ යටතේ 2018 වසර අවසානය වන විට විට මගී මැදිරි 68 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා භාර දී ඇති අතර පුනරුත්ථාපන කටයුතු අවසන් කර මැදිරි 52 ක් සේවය සඳහා යොදවා ඇත.

03. **දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම**

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ මාර්ග ධාරිතාවය වැඩි කිරීමේ අරමුණෙන් මුහුදුබඩ දුම්රිය මාර්ග යේ දුම්රිය ප්‍රවාහන කටයුතු තව දුරටත් කාර්යක්ෂම කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

04. **ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය**

තදාසන්න දුම්රිය සේවාව වඩා කාර්යක්ෂම හා මගී ආකර්ෂණය හා වැඩි මගී නැඹුරුවක් ඇති කිරීමේ අරමුණෙන් ප්‍රධාන මාර්ගය, කැළණිවැලි, මුහුදුබඩ හා පුත්තලම දුම්රිය මාර්ග ආවරණය වන පරිදි දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ විශේෂ අරමුණ වේ. තදාසන්න ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීම දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම ආදී ව්‍යාපෘති රාශියක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.

05. **දුම්රිය ඇණිය මිලදී ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.**

06. **මහව ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම**

07. **පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම**

08. **කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.**

09. **පුත්තලම දුම්රිය මාර්ගයේ සිදුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම**

10. **හංගේරියානු ආධාර යටතේ ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ස්ථාපිත කිරීම**

ප්‍රමුඛතා පදනම යටතේ සියලුම දුම්රිය මාර්ගයන් ආවරණය වන පරිදි හංගේරියානු ණය ආධාර යටතේ ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200 ක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති අතර මේ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

11. **නව කැළණි පාළම ස්ථාපිත කිරීම**

ඔස්ට්‍රියානු රජයේ ණය ආධාර යටතේ නව කැළණි පාළම ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර අදාළ තෝරා ගත් ලංසුකරුවන් වෙත ලියවිලි ලබා දී ඇත.

12. **දුම්රිය සේවය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම**

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර යටතේ දුම්රිය සේවාව සංවර්ධනය කිරීම පුළුල් සැලැස්මක් සැකසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙය 2035 වර්ෂය දක්වා සිදු කරන දුම්රිය කටයුතු පිළිබඳ ඒකාබද්ධ සැලැස්මක් වන අතර ඒ සඳහා අදාළ සියලු පාර්ශවයන් සම්බන්ධ වේ.

## උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන්

| | උප දෙපාර්තමේන්තු/ඒකක | උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන් |
|---|---|---|
| 01 | දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය | |
| 02 | ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව | ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) |
| 03 | ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව | ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත |
| 04 | ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) උප දෙපාර්තමේන්තුව | ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) |
| 05 | ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව | ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ) |
| 06 | ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව | ප්‍රධාන මූල්‍ය නිලධාරි |
| 07 | වාණිජ උප දෙපාර්තමේන්තුව | වාණිජ අධිකාරි |
| 08 | දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව | ගබඩා අධිකාරි |
| 09 | ගමනාගමන උප දෙපාර්තමේන්තුව | ගමනාගමන අධිකාරි |
| 10 | ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය | ආරක්ෂක අධිකාරි |
| 11 | ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි පුහුණු හා මානව සම්පත් |
| 12 | ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය | ප්‍රධාන පිරිවැය නිලධාරි |
| 13 | සැලසුම් ඒකකය | අධ්‍යක්ෂ (සැලසුම්) |
| 14 | දත්ත සැකසුම් ඒකකය | කළමනාකරු දත්ත සැකසුම් |

වගු අංක 01

## සංවිධාන ව්‍යුහය - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය සාමාන්‍යාධිකාරි

- අති.දුම්. සාමාන්‍යාධිකාරි (යාන්ත්‍රික )
- අති.දුම්. සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)
- අති.දුම්. සාමාන්‍යාධිකාරි (පරිපාලන)
- අති.දුම්. සාමාන්‍යාධිකාරි (යටිතල පහසුකම්)

### (ආ) අනුමත කාර්ය මණ්ඩල ධූරාවලිය

| කාර්ය මණ්ඩලය | අනුමත සංඛ්‍යාව | වර්තමාන සංඛ්‍යාව |
|---|---|---|
| විධායක | 212 | 137 |
| ද්විතීක | 11,215 | 6,385 |
| තෘතීක | 415 | 146 |
| කණිෂ්ඨ | 8,601 | 8,217 |
| **එකතුව** | **20,443** | **14,885** |

වගු අංක 02

**දුම්රිය මාර්ග ජාලය**

| අංකය | මාර්ගය | දුර කි.මී. | දුම්රිය ස්ථාන | උප දුම්රිය ස්ථාන | නැවතුම් |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රධාන මාර්ගය | 290 | 45 | 33 | 26 |
| 02 | මාතලේ මාර්ගය | 33 | 6 | 6 | 12 |
| 03 | පුත්තලම් මාර්ගය | 157 | 19 | 25 | 0 |
| 04 | කැළණිවැලි මාර්ගය | 59 | 11 | 19 | 7 |
| 05 | මඩකලපුව මාර්ගය | 207 | 14 | 17 | 5 |
| 06 | උතුරු මාර්ගය | 411 | 31 | 26 | 17 |
| 07 | ත්‍රිකුණාමලය මාර්ගය | 33 | 4 | 2 | 2 |
| 08 | මුහුදුබඩ මාර්ගය | 159 | 37 | 31 | 0 |
| 09 | තලෙයිමන්නාරම් මාර්ගය | 106 | 7 | 4 | 0 |
| 10 | මිහින්තලේ මාර්ගය | 10 | 1 | 0 | 2 |
| | **එකතුව** | **1465** | **175** | **163** | **71** |

වගු අංක 03

## 3. සමස්ථ විග්‍රහය

ප්‍රධාන ප්‍රවාහන සේවා සැපයුම් කරුවෙකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2018 වර්ෂයේදී ද මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල නියලෙමින් ශ්‍රී ලංකා ආර්ථික ක්ෂේත්‍රයේ අඛණ්ඩ දායකත්වයක් ලබා දුණි. මේ සඳහා දුම්රිය ඇණිය, දුම්රිය මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම, දුම්රිය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම, සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ නඩත්තුව සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2018 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. 2018 වර්ෂයේ අත්පත් කර ගත් ප්‍රධාන කාර්යසාධනයන් අතර නව දුම්රිය ඇණිය මිල දී ගැනීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම, ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200 ක් ස්ථාපිත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම, මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම, ආදී නව කාර්යයන් රාශියක් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

2018 වර්ෂයේදී සමස්ත මූල්‍ය කාර්යසාධනය දෙස බැලීමේදී ද මුළු ආදායම රු. මි. 7,412.51 ක් වූ අතර එය 2017 වර්ෂයේ රු.මි. 6,477.11 ක් විය. මෙය 2017 වර්ෂය හා සසඳන විට 14 % ක වැඩි වීමක් පෙන්නුම් කරයි. මගී සංඛ්‍යාව 2017 ට සාපේක්ෂව 0.7% ක වැඩි වීමක් පෙන්නුම් කරන අතර එය 2017 වර්ෂයේ මිලියන 136.60 ක් හා 2017 වර්ෂයේ මිලියන 137.52 කි. 2018 වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහන ආදායම හා භාණ්ඩ ටොන් ප්‍රමාණයේ අඩුවීමක් වීමක් පෙන්නුම් කරන අතර 2017 හා 2018 කාලය තුළදී පිළිවෙලින් භාණ්ඩ ප්‍රවාහන ආදායම රු.මි. 429.11 - රු.මි.418.22 දක්වා ද භාණ්ඩ ටොන් මිලියන 2.00 - 1.84 දක්වා අඩුවීමක් වීමක් පෙන්නුම් කරයි. එයට බලපාන ලද ප්‍රධාන සාධකය ලෙස 2018 වසරේ පැවති දුම්රිය වර්ජන හා දුම්රිය අවලංගුවීම්, එංජින් හිගතාවය, තෙල් ප්‍රවාහන කටයුතු අවම වීම හා ගල් අඟුරු ප්‍රවාහන කටයුතු අවම වීම යනාදිය දැක්විය හැකිය. මගී කි.මී. ප්‍රමාණය 2017 වර්ෂයේ මිලියන 7,495.06 හා 2018 වර්ෂය අවසන් වන විට මිලියන 7,709.52 දක්වා 2.8 % කින්ද වර්ධනය වී ඇති අතර භාණ්ඩ ටොන් කි.මී.ප්‍රමාණය 2017 වර්ෂයේ මිලියන 144.79 ප්‍රමාණය 2018 වර්ෂය වන විට 119.78 දක්වා අඩු වී ඇත.

### ගමන්කල මගී සංඛ්‍යාව හා මගී ආදායම

| වර්ෂය | ගමන්කළ මගීන් සංඛ්‍යාව (මි) | මගී ආදායම රු. (මි) |
|---|---|---|
| 2017 | 136.60 | 5,357.91 |
| 2018 | 137.52 | 5,933.28 |

වගු අංක 04

2017 වර්ෂයේ මගීන් මිලියන 136.60 ක් දුම්රියෙන් ගමන් කරන ලද අතර 2018 වර්ෂයේදී 137.52 ගමන් කර ඇත. එය 0.6% ක වර්ධනයකි. එමෙන්ම මගී ආදායමෙහිද වර්ධනයක් සිදුවී ඇත. 2017 වසරේ මගී ආදායම 5,357.91 ක් වන අතර 2018 වර්ෂයේදී මගී ආදායම 5, 933.28 කි. එය 10% ක වර්ධනයකි. මේ සඳහා ප්‍රධාන හේතු සාධකය වුයේ දුම්රියෙන් ගමන් කරන ලද මගීන්ගේ වැඩිවීමත් 2018 වර්ෂයේ ඔක්තෝම්බර් 01 දින සිට දුම්රිය ගාස්තු වැඩිවීමත්ය.

පාර්සල් හා තැපැල් ආදායමද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී 23% කින් වර්ධනයක් සිදුවී ඇත. 2017 වර්ෂයේදී එම ආදායම රුපියල් මිලියන 171.27 වන අතර 2018 වසරේදී රුපියල් මිලියන 209.82 දක්වා වර්ධනයක් හඳුනාගත හැකිය. විවිධ ආදායමේද සීග්‍ර වර්ධනයක් හඳුනාගත හැකිය. 2017 වසරේදී එම ආදායම රුපියල් මිලියන 518.81 ක්ද 2018 වසරේදී රුපියල් මිලියන 851.18 දක්වා 64% ක වර්ධනයක් සිදුවී තිබේ. විශේෂයෙන්ම අබලි යකඩ විකිණීමෙන් මෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රචාරන කටයුතු, ප්‍රීමා පිටි ප්‍රවාහනය, ගල් අඟුරු ප්‍රවාහනය, හොල්සිම් සිමෙන්ති ප්‍රවාහන ආදායම් වර්ධනය වීම මෙම ආදායම වර්ධනය සඳහා ප්‍රධාන සාධකයන් වී ඇත.

2017 වර්ෂය අවසන් වන විට මුළු වියදම රු.මි. 26,969.53 ක් වූ අතර මේ තුළ රුපියල් මිලියන 14,080.65 ක් පුනරාවර්ථන වියදම හා රු.මි. 12,888.87 ක් වූ ප්‍රාග්ධන වියදම ඇතුළත් වේ. 2018 වසරේදී මුළු වියදම රු.මි. 29,629.18 ක් වූ අතර පුනරාවර්ථන වියදම රු.මි.14,380.54 ක් හා ප්‍රාග්ධන වියදම රු.මි. 15,248.63 ක් ලෙස එහි ඇතුළත් වේ. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී ප්‍රාග්ධන වියදමෙහි 9.8 % ක පමණ වර්ධනයක් පෙන්නුම් කරයි. අලුතින් ගෙන්වන ලද දුම්රියන් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම ඉන්දියාව මගින් ඉදිකළ උතුරු දුම්රිය මාර්ග සඳහා රඳවාගත් මුදල් ගෙවීම මෙලෙස ප්‍රාග්ධන වියදමෙහි වැඩිවීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක. 2017 වර්ෂයේදී පුනරාවර්ථන වියදම රු.මි. 14,080.65 ක් සහ 2018 වර්ෂයේ රු. මි 14,380.54 ක් ලෙස 2.1% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එයට බලපෑ ප්‍රධාන කරුණ ලෙස දැක්විය හැක්කේ සේවක වැටුප් ඉහළ යෑමයි.

### කාර්ය සාධන දර්ශකයන්

කාර්ය සාධන දර්ශකයන් කීපයක් පහත වගු අංක 05 න් දැක්වේ.

| අංකය | කාර්ය සාධන දර්ශකය | වර්ෂය | |
|---|---|---|---|
| | | 2017 | 2018 |
| 01 | දුම්රිය ආදායම (රු.මි.) | 6,477.11 | 7,412.51 |
| 02 | ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන) | 136.60 | 137.52 |
| 03 | මගී කි.මී. ප්‍රමාණය (මිලියන) | 7,495.06 | 7,709.52 |
| 04 | ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන) | 2.00 | 1.84 |
| 05 | භාණ්ඩ ටොන් කි.මී. (මිලියන) | 144.79 | 119.78 |

වගු අංක 05

# 4. මූල්‍ය කාර්යක්ෂමතාවය

## ආදායම

2018 වර්ෂයේදී දුම්රිය ආදායම රු.මි.7,412.51 ක් වූ අතර 2017 දී රු.මි. 6,477.11 ක් විය. 2018 වර්ෂයේ මුළු ආදායමේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 14% ක් විය. සියලු ආදායම් බාණ්ඩයන්හි ආදායම වගු අංක 06 හි දැක්වේ.

| | ආදායම් බාණ්ඩය | ආදායම (රු.මි.) | | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | |
| 01 | මගී | 5,357.91 | 5,933.28 | 10% |
| 02 | පාර්සල් සහ තැපැල් | 171.27 | 209.82 | 22% |
| 03 | භාණ්ඩ හා පශු සම්පත් | 429.11 | 418.22 | -2.5% |
| 04 | වෙනත් | 518.8 | 851.18 | 66% |
| | **එකතුව** | **6,477.11** | **7,412.51** | **14%** |

**වගු අංක 06**

දුම්රිය ආදායම් තුළ ප්‍රධාන ආදායම් බාණ්ඩය වන දුම්රිය මගී ආදායම 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේ රු.මි. 5,933.28ක් වූ අතර 2017 වර්ෂයේදී රු.මි. 5,357.91 දක්වා 10 % ක වර්ධනයක් පෙන්නුම් කරයි. පාර්සල් හා තැපැල් ආදායම 22 % කින්ද භාණ්ඩ ප්‍රවාහන ආදායම -2.5 % කින් අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර වෙනත් ආදායම් 66 % කින්ද වර්ධනය වී ඇත. විශේෂයෙන්ම භාණ්ඩ හා පශු සම්පත් ආදායමේ යම් අඩුවීමක් පෙන්නුම් කරයි. භාණ්ඩ ප්‍රවාහන කටයුතු අඩුවීම, 2018 වසරේ පැවති වැඩවර්ජන හේතුවෙන් දුම්රිය අවලංගුවීම් ආදිය මෙම භාණ්ඩ ආදායම අඩුවීමට දායක වූ කරුණු විය.

## වියදම

2017 වර්ෂය තුළ සමස්ත වියදමේ වැඩිවීමක් පෙන්නුම් කරන අතර 2017 වර්ෂයේදී රු.මි. 26,969.53 ක් වූ අතර 2018 වර්ෂය වන විට රු.මි. 29,629.18 ක් විය. මෙය සමස්ත වියදමෙහි 9.8 % ක වර්ධනය වීමකි. 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මි. 14,080.65 ක් වූ අතර 2018 වර්ෂයේදී එම වියදම රු.මි. 14,380.54 ක් හා 2017 වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.මි. 12,888.87 ක් වූ අතර 2018 වර්ෂයේ රු.මි. 15,248.63 ක් විය. ප්‍රාග්ධන වියදම 18 % කින් වැඩි වී ඇති අතර එයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අලුතින් ගෙනවන ලද දුම්රියන් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම ඉන්දියාව මගින් ඉදිකළ උතුරු දුම්රිය මාර්ග සදහා රඳවාගත් මුදල් ගෙවීමයි.


මූල්‍ය වියදම සහ අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රගතිය පහත වගු අංක 07 න් දැක්වේ.

## තත්‍ය වියදම් හා එහි ප්‍රගතිය

### තත්‍ය වියදම

| අංකය | වියදම | තත්‍ය වියදම (රු.මි.) | | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | | 2016 | 2017 | |
| 01 | පුනරාවර්තන වියදම | 14,080.65 | 14,380.54 | 2.1% |
| 02 | ප්‍රාග්ධන වියදම | 12,888.87 | 15,248.63 | 18% |
| | **මුළු වියදම** | **26,969.53** | **29,629.18** | **9.8%** |

වගු අංක 07




ප්‍රස්ථාර අංක 01

### අරමුදල් භාවිතය 2017 වර්ෂය

| | අරමුදල | ප්‍රාග්ධන වියදම (රු.මි.) | පුනරාවර්තන වියදම (රු.මි.) | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | විදේශීය අරමුදල් | - | 4,369.31 | 4,369.31 |
| 02 | අනෙකුත් දේශීය අරමුදල් | - | 657.43 | 657.43 |
| 03 | ඒකාබද්ධ අරමුදල් | 14,380.54 | 2,181.72 | 16,562.26 |
| | **එකතුව** | **8,040.15** | **21,598** | |

වගු අංක 08

2018 වර්ෂයේදී සියළු උප දෙපාර්තමේන්තු මඟින් සිය කටයුතු පවත්වා ගෙන යාමේදී දරන ලද වැය පිළිබඳ විස්තර පහත වගු අංක 09 න් දැක්වේ.

## උප දෙපාර්තමේන්තු වල මූල්‍ය ප්‍රගතිය - 2017

| අංකය | උප දෙපාර්තමේන්තුව | වෙන්කළ මුදල (රු.මි.) | | තත්‍ය වියදම (රු.මි.) | | ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 01 | දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය (දුසා, ප්‍රදුග, දුගඅ) | 695.25 | 20.83 | 663.31 | 19.13 | 95.41 | 91.81 |
| 02 | ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය | 28.47 | 5.70 | 27.75 | 5.32 | 97.49 | 93.49 |
| 03 | ගමනාගමන උප දෙපාර්තමේන්තුව | 3,362.35 | 23.63 | 3,362.46 | 23.63 | 100.00 | 100.00 |
| 04 | වාණිජ උප දෙපාර්තමේන්තුව | 59.41 | 4.13 | 57.36 | 4.13 | 96.55 | 100.00 |
| 05 | ආරක්ෂක හමුදාව | 420.52 | 0.79 | 416.95 | 0.79 | 99.51 | 100.00 |
| 06 | ධාවන බල උප දෙපාර්තමේන්තුව | 6,036.51 | 1,446.01 | 6,026.23 | 1,442.97 | 99.82 | 99.79 |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව | 1,317.46 | 9,382.59 | 1,313.62 | 8,085.99 | 99.71 | 86.18 |
| 08 | මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුව | 2,165.94 | 4,510.64 | 2,166.56 | 4,453.95 | 100.03 | 98.74 |
| 19 | සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව | 346.53 | 1,479.29 | 346.25 | 1,212.68 | 99.92 | 81.98 |
| | **එකතුව** | **14,432.48** | **16,873.65** | **14,380.54** | **15,248.63** | **99.46** | **90.37** |

**වගු අංක 09**

## 5. මෙහෙයුම් කාර්යක්ෂමතාව

2018 වර්ෂයේදී පැවති දුම්රිය වැඩ වර්ජනයන් කීපයක් හේතුවෙන් දුම්රිය මෙහෙයුම් කටයුතු කෙරෙහි යම් බලපෑමක් එල්ල වුවද මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි වුණි. කෙසේ වුවද 2018 වර්ෂයේදී මගී දුම්රිය හා භාණ්ඩ දුම්රියන්හි මෙහෙයුම් කටයුතු 2017 වසර හා සසඳන විට යම් ප්‍රගතියකින් යුතුව පවත්වාගෙන යන ලදී.

### මගී ප්‍රවාහනය


2018 වර්ෂයේදී මගී ප්‍රවාහන දුම්රිය 117,189 ක් ධාවනය කිරීමට හැකි විය. ඒ තුළින් ගමන් ගත් මගී සංඛ්‍යාව මිලියන 137.52 ක් පමණ වේ. මෙය 2017 වසරේ 136.66 ක් වූ අතර 2017 වසර හා සසඳන විට එය 0.6 % ක පමණ වැඩි වීමකි. මගී කි.මී. ප්‍රමාණය 2018 වර්ෂයේදී 7,709.52 ක් හා 2017 වර්ෂයේදී 7495.06 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව 2.8 % කින් වැඩි වී තිබේ. තවද 2018 වර්ෂයේදී නව දුම්රිය සේවා කීපයක් හඳුන්වා දුන් අතර මහනුවර - ඇල්ල සති අන්ත නව දුම්රිය සේවයක් ආරම්භ කිරීම, මගී සුව පහසුව ඇති කිරීම සඳහා දිනපතා උදේ මොරටුව දක්වා ධාවනය වූ දුම්රිය පානදුර දක්වා දීර්ඝ කිරීම හා දිනපතා වේයන්ගොඩ දක්වා ධාවනය වූ දුම්රිය මීරිගම දක්වා දීර්ඝ කිරීම සිදුවිය. සෙනසුරාදා දිනවල හික්කඩුව සිට මරදාන බලා ධාවනය වූ දුම්රිය ගාල්ල දක්වාත්, මරදානේ සිට ගාල්ල දක්වා ධාවනය වූ දුම්රිය මාතර දක්වාත්, ඉරිදා දිනවල ගාල්ලේ සිට මරදාන දක්වා ධාවනය වූ දුම්රිය මාතර සිට ගමන් ආරම්භ කිරීම. මෙහිදී මහජනතාවට වඩාත් කාර්යක්ෂම දුම්රිය සේවාවක් ලබාදීම සිදුවිය.

මගී ප්‍රවාහන කටයුතු වල ගුණාත්මකභාවය තව දුරටත් වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ අතර දුම්රිය ස්ථානයන් නවීකරණය කිරීම, සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම, දුම්රිය වේදිකා දීර්ඝ කිරීම හා වේදිකා ඉස්සීම ආදී කරුණු ද ක්‍රියාත්මක කරන ලදී.


මගී දුම්රිය ධාවනය සම්බන්ධ සංඛ්‍යා දත්ත කිහිපයක් පහත වගුවෙහි පෙන්නුම් කෙරේ.

| අංකය | දර්ශකය | 2017 | 2018 | වර්ධනය වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01 | මගී කි.මී | 7,495.06 | 7,709.52 | 2.8% |
| 02 | මගී සංඛ්‍යාව | 136.66 | 137.52 | 0.6% |

වගු අංක 10




ප්‍රස්ථාර අංක 02




ප්‍රස්ථාර අංක 03

**භාණ්ඩ ප්‍රවාහනය**

පසුගිය වසර හා සසඳන විට භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. 2017 වසරේ භාණ්ඩ ටොන් මිලියන 2.00 සිට 2018 වසරේ භාණ්ඩ ටොන් මිලියන 1.84 දක්වා -8 % කින් අඩුවීමක්ද භාණ්ඩ ප්‍රවාහන ආදායම 2018 වසරේ රු.මි. 418.22 ක් හා 2017 වසරේ 429.11 දක්වා -2.5 කින් ද අඩු වී ඇත. මෙම තත්වය කෙරෙහි බලපෑ ප්‍රධාන කරුණු අතර 2018 අගෝස්තු මාසයේ පැවති දුම්රිය වැඩවර්ජන හේතුවෙන් දුම්රිය ගමන් අවලංගු වීම හා ඊට සමගාමීව භාණ්ඩ දුම්රියන්ද අවලංගු විමත් දින කිහිපයක් දුම්රිය වර්ජන පැවතීම හේතුවෙන් එම කාලය තුළ ජනතාව භාණ්ඩ දුම්රියෙන් ප්‍රවාහනය කිරීමට දක්වන ලද මැලි භාවයත් යන කරුණුය.

එක් එක් ඛාණ්ඩයන් යටතේ 2018 වසර තුළ ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය වගු අංක 11 න් දැක්වේ.


| | **විස්තරය** | **ටොන් ප්‍රමාණය** |
|---|---|---|
| 1 | කෘෂිකාර්මික නිෂ්පාදන | 14,727 |
| 2 | ඛණිජ තෙල් නිෂ්පාදන | 676,087 |
| 3 | සිමෙන්ති | 1,140,540 |
| 4 | නිපැයුම් | 2,003 |
| 5 | ඉදිකිරීම් ද්‍රව්‍ය | 180 |
| 6 | වෙනත් | 3,488 |
| | **එකතුව** | **1,837,025** |

වගු අංක 11

2017 හා 2018 වර්ෂයන්හි දුම්රිය භාණ්ඩ සම්බන්ධ සංඛ්‍යා දත්ත පහත සඳහන් පරිදි දැක්විය හැක.

| **අංකය** | **දර්ශකය** | **2017** | **2018** | **%** |
|---|---|---|---|---|
| 01 | භාණ්ඩ කි.මී (මි) | 144.79 | 119.78 | -17.27 |
| 02 | භාණ්ඩ ප්‍රමාණය ටොන් (මි) | 2.00 | 1.84 | -8 |
| 03 | ධාවනය කරන ලද භාණ්ඩ දුම්රිය සංඛ්‍යාව | 6,590 | 6,845 | 3.8 |
| 04 | භාණ්ඩ ආදායම (රු.මි) | 429.11 | 418.22 | -2.25 |

වගු අංක 12




ප්‍රස්ථාර අංක 04

### සමස්ථ දුම්රිය ධාවනය

| දුම්රිය සේවය | සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව | ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව | නියමිත වේලාවට ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව | ප්‍රමාද වී ධාවනය වීම් | | | අවලංගු වූ දුම්රිය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | | 11-30 | 31-60 | 60 ට වැඩි | |
| තදාසන්න | 68,124 | 66,977 | 43,759 | 19,444 | 3,184 | 590 | 174 |
| ප්‍රාදේශීය | 27,180 | 25,490 | 14,018 | 6,891 | 2,861 | 1,720 | 1,690 |
| දුරස්ථ හා නගරාන්තර | 21,441 | 21,267 | 6,180 | 7,167 | 5,279 | 2,641 | 1,147 |
| රේල් බස් | 4,728 | 3,455 | 2,235 | 884 | 249 | 87 | 1,273 |
| i මගී | 121,473 | 117,189 | 66,192 | 34,386 | 11,573 | 5,038 | 4,284 |
| ii භාණ්ඩ | 8,911 | 6,845 | 1,131 | 369 | 638 | 4,707 | 2,066 |
| **එකතුව** | **130,384** | **124,034** | **67,323** | **34,55** | **12,211** | **9,745** | **6,350** |

වගු අංක 13

ඉහත වගු අංක 13 හි දැක්වෙන තොරතුරු අනුව 2018 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව 121,473 ක් වූ අතර එයින් 117,189 ක් ධාවනය කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 96% කි. ධාවනය වූ මගී දුම්රිය සංඛ්‍යාවෙන් 66,192 ක් පමණ නියමිත වේලාවට ධාවනය කිරීමට හැකි වූ අතර එය 56 % ක ප්‍රතිශතයකි.

භාණ්ඩ දුම්රිය 8,911 ක් සැලසුම් කර ඇති අතර ධාවනය කර ඇති දුම්රිය සංඛ්‍යාව 6,845 ක් වේ. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 76% කි.

## දුම්රිය ධාවනය

| විස්තරය | බලවේග කට්ටල ධාවනය වීම් (කි.මී.) | බලවේග කට්ටල අවලංගු වීම් (කි.මී) | ඩීසල් දුම්රිය ධාවනය වීම් (කි.මී.) | ඩීසල් දුම්රිය අවලංගු වීම් (කි.මී.) | ධාවනය වීම් එකතුව (කි.මී.) | අවලංගු වීම් එකතුව (කි.මී) |
|---|---|---|---|---|---|---|
| තදාසන්න | 303,693.49 | 1,414.50 | 38,060.42 | 124.89 | 341,753.91 | 1,539.39 |
| දුරස්ථ/ නගරාන්තර | 151,336.19 | 84.43 | 296,056.03 | 76.05 | 447,392.22 | 160.48 |
| ප්‍රාදේශීය | 4,505 | 0 | 123,915.47 | 8,281.79 | 128,420.47 | 8,281.79 |
| රේල් බස් | 0 | 0 | 12,970.50 | 277.85 | 12,970.50 | 277.85 |
| i මගී | 459,534.68 | 1,498.93 | 471,002.42 | 8,760.58 | 93,0537.10 | 10,259.51 |
| ii භාණ්ඩ | 0 | 0 | 43,057.75 | 16,836.59 | 43,057.75 | 16,836.59 |
| iii හිස් දුම්රිය | 3,729 | 0 | 1,846.0 | 0 | 5,575.0 | 0 |
| iv සැහැල්ලු දුම්රිය | 0 | 0 | 10,524.34 | 0 | 10,524.34 | 0 |
| විශේෂ දුම්රිය | 0 | 0 | 0 | 0 | 17,905.21 | 0 |

වගු අංක 14

## දුම්රිය අනතුරු නිසා මහජනතාවට සිදු වූ හානි

| කාරණය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | තුවාල වීම් | මරණ | තුවාල වීම් | මරණ |
| පීලි පැනීම් නිසා සිදු වූ තුවාල හා මරණ | 0 | 0 | 0 | 0 |
| දුම්රිය ගැටීම නිසා සිදු වූ තුවාල හා මරණ | 0 | 0 | 32 | 0 |
| දුම්රියෙන් වැටීම නිසා සිදු වූ තුවාල හා මරණ | 70 | 04 | 102 | 05 |
| දුම්රියට ගල් ගැසීම නිසා සිදු වූ තුවාල හා මරණ | 17 | 0 | 17 | 0 |
| දුම්රිය හරස් මාර්ගයන්හිදී රථ වාහන දුම්රිය සමඟ ගැටීම නිසා සාමාන්‍ය ජනතාවට සිදු වූ අනතුරු | 59 | 12 | 69 | 13 |
| දුම්රිය මාර්ගයේදී දුම්රියේ ගැටීම නිසා සිදු වූ සිය දිවි නසා ගැනීම් හා දුම්රිය මාර්ගයේ දී පුද්ගලයන්ගේ අපරීක්ෂාකාරී හැසිරීම නිසා ඇති වූ අනතුරු | 260 | 180 | 254 | 212 |

වගු අංක 15

ඉහත දත්ත සැලකීමේදී 2018 වසරේ දුම්රිය අනතුරු වලින් තුවාල ලැබූ සහ මරණ සංඛ්‍යාවේ සුළු වැඩි වීමක් පෙන්නුම් කරයි. දුම්රිය පීලි පැනීම් හේතුවෙන් සහ දුම්රිය ගැටීම නිසා මරණ සිදු වී නොමැති අතර තුවාල වීම් 32 ක් වාර්තා වී ඇත. සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් නිසා සිදු වූ තුවාල වීම් 254 ක් හා මරණ සංඛ්‍යාව 212 ක් ලෙස වාර්තා වී ඇත. පසුගිය වසර හා සසඳන

විට තුවාල වීම් වල සුළු වැඩිවීමක් පෙන්නුම් කරන අතර අපරික්ෂාකාරී ලෙස දුම්රිය මාර්ගයන්ට අවතීරණ වීමත්, දුම්රිය මාර්ගයන්හි ගමන් කිරීමේදී පුද්ගලයින්ගේ අපරික්ෂාකාරී හැසිරීම මෙම වැඩි වීමට බලපෑ කරුණක් ලෙස දැක්විය හැක.

**මගී පහසුකම් හා වෙනත් සංවර්ධන කටයුතු**

2017 වර්ෂයේදී දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම මගින් මගී පහසුකම් ඇති කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ගත් අතර ඉන් කීපයක් පහත සඳහන් පරිදි දැක්විය හැක.

- ආබාධිත මගීන් සඳහා පහසුකම් සංවර්ධනය කිරීම (රෝද පුටු, ආබාධිත පුද්ගලයින්ට ගමන් කිරීම සදහා මංතීරු ඉදි කිරීම, වැසිකිලි පහසුකම් ඇති කිරීම, ආබාධිත ප්‍රවේශ මාර්ග ඇති කිරීම )
- මහනුවර - ඇල්ල සති අන්ත නව දුම්රිය සේවයක් ආරම්භ කිරීම
- මගී සුව පහසුව ඇති කිරීම සඳහා දිනපතා මොරටුව දක්වා ධාවනය වූ දුම්රිය පානදුර දක්වා දීර්ඝ කිරීම
- දිනපතා වේයන්ගොඩ දක්වා ධාවනය වු දුම්රිය මීරිගම දක්වා දීර්ඝ කිරීම
- සෙනසුරාදා දිනවල හික්කඩුව සිට මරදාන බලා ධාවනය වූ දුම්රිය ගාල්ල දක්වාත්, මරදානේ සිට ගාල්ල දක්වා ධාවනය වූ දුම්රිය මාතර දක්වාත්, ඉරිදා දිනවල ගාල්ලේ සිට මරදාන දක්වා ධාවනය වූ දුම්රිය මාතර සිට ගමන් ආරම්භ කිරීම.
- දුම්රිය ස්ථාන විවේක කාමර නවීකරණය හා ඒවා මගීන්ට පහසුවෙන් වෙන් කර ගත හැකි වන ක්‍රමවේද සැකසීම
- නව දුම්රිය හා මගී පාළම්, දුම්රිය ස්ථාන වේදිකා ඉස්සීම හා දීර්ඝ කිරීම, දුම්රිය ස්ථාන ගොඩනැගිලි නඩත්තු කටයුතු
- ප්‍රධාන දුම්රිය ස්ථාන වල වෙළඳසැල් විවෘත කිරීම
- නගරාන්තර දුම්රියන්ගෙන් ගමන් කිරීමට ප්‍රවේශපත් වෙන් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු වැඩි දියුණු කිරීම
- 2018 වසර තුළ වව්නියාව, පානදුර, යාපනය, කටුගන්නාව, බණ්ඩාරවෙල, වේයන්ගොඩ යන දුම්රිය ස්ථාන 06 ක් සඳහා ආපනශාලා පහසුකම් මෙම වසර තුළ ලබාදීමට කටයුතු කරන ලදී
- සුළු අලෙවිසැල්, කඩ කාමර, රථ ගාල් වැනි අංග ඇති කිරීමෙන් දුම්රිය මගීන්ට අමතර සේවාවන් ලබා දීම
- 2018 වර්ෂයේ දී අලුතෙන් ATM යන්ත්‍ර 08 ක් රඹුක්කන, මීගමුව, ගනේමුල්ල, රාගම, මහනුවර, ගම්පොල, නාවලපිටිය, කන්කසන්තුරය යන දුම්රිය ස්ථානවල මගී ජනතාවගේ පහසුව සඳහා ස්ථාපිත කර ඇත
- මගීන්ගේ සුව පහසුව සදහා කොළඹ කොටුව සිට මහනුවර දක්වා ධාවනය වන දුම්රිය සඳහා බිලු ලයින් (Blue Line) නමින් අධි සුඛෝපභෝගී දුම්රිය මැදිරියක් එක් කිරීම සඳහා පෞද්ගලික අංශය සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී

## 6. ධාවන බල සැපයුම සහ දුම්රිය ඇණිය

**දුම්රිය ඇණිය**

2018 වර්ෂයේ සේවය සඳහා යොදවා තිබූ දුම්රිය ඇණිය පිළිබඳව විස්තර පහත වගු අංක 16 න් දැක්වේ.

| අංකය | වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| | | |
| 01 | දුම්රිය එංජින් | 84 |
| 02 | බලවේග කට්ටල | 149 |
| 03 | මගී මැදිරි | 825 |
| 04 | ගැල් | 787 |

**වගු අංක 16**

පැරණි දුම්රිය එන්ජින් නඩත්තු කටයුතු හා ඒ සඳහා අමතර කොටස් හා සේවා පහසුකම් ලබා ගැනීම් දැඩි දුෂ්කරතා හමුවේ වුවද කාර්යක්ෂම දුම්රිය සේවයක් ලබා දීම සඳහා දුම්රිය ඇණියේ අලුත්වැඩියාවන් නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් 2018 වර්ෂයේද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම වසර තුළ පවතින දුම්රිය එන්ජින් වලින් එන්ජින් 84 ක් හා බලවේග කට්ටල 149 ක් සේවාව සැපයීම සඳහා සාමාන්‍ය මට්ටමක යොදා ගෙන තිබේ.

මගී මැදිරි සහ දුම්රිය එන්ජින් අලුත්වැඩියාව සහ නඩත්තුව අඛණ්ඩව සිදු කිරීම තුළින් 2018 වර්ෂය තුළ දුම්රිය ඇණිය සඳහා සුළු අලුත්වැඩියාවන් 33,525 ක් හා විශාල අලුත්වැඩියාවන් 1,842 නිම කර ඇත. තවද පුනරුත්ථාපනය කරන ලද මගී මැදිරි 52 ක් නැවත සේවයට යෙදවීමට හැකි විය. ඊට අමතරව දුම්රිය එන්ජින් 03 ක් පුනරුත්ථාපනය කටයුතු නිම කරන ලද අතර එය දැනට ධාවනය සඳහා එක්කර ඇත. එක් එන්ජිමක් පුනරුත්ථාපන කටයුතු සිදුකරමින් පවතී. තෙල් ටැංකි වැගන් 03 ක් පුනරුත්ථාපන කටයුතු නිම කරන ලද අතර එක් ටැංකි වැගනයක පුනරුත්ථාපනය කටයුතු සිදු කරමින් පවතී.




**2018 වර්ෂයේ පුනරුත්ථාපනය කර ධාවනය සඳහා යොදවන ලද S8 මාදිලියේ දුම්රිය එංජිම**

ඉන්දීය ණය ආධාර යටතේ, පවතින දුම්රිය ඇණිය වර්ධනය කිරීම සඳහා නව මිල දී ගැනීම් කඩිනමින් ආරම්භ කරන ලද අතර මේ යටතේ බලවේග කට්ටලයක් හා දුම්රිය එන්ජිමක් 2018 වසරේ දෙසැම්බර් මාසයේ ලංකාවට ගෙන්වා ඇත. මේ යටතේ පහත සඳහන් ප්‍රධාන මිල දී ගැනීම් කීපයක් ඇතුළත් වේ.

- බලවේග කට්ටල 06 ක් මිල දී ගැනීම ( එක් බලවේග කට්ටලයක් ගෙන්වා ඇත)
- දුම්රිය එංජින් 10 ක් මිල දී ගැනීම (එන්ජිමක් ගෙන්වා ඇත)
- තෙල් ටැංකි වැගන් 30 ක් මිල දී ගැනීම (අත්තිකාරම් මුදල් ගෙවා ඇත)
- කන්ටේනර් ප්ලැට් වැගන් 20 ක් මිල දී ගැනීම (අත්තිකාරම් මුදල් ගෙවා ඇත)
- උඩරට දුම්රිය සේවය වැඩිදියුණු කිරීම සඳහා බලවේග කට්ටල 09 ක් හා දුම්රිය එංජින් 12 ක් ගෙන්වීමට නියමිත අතර එංජින් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇගයීම් කටයුතු ආරම්භ කරන ලදි. බලවේග කට්ටල් 09 න් පළමු බලවේග කට්ටලය 2019 ජුලි හෝ අගෝස්තු මාසයේ ලංකාවට ඒමට නියමිතය.




2018 වසරේ ඉන්දියාවෙන් ගෙන්වා ධාවනයට එක්කල එස් 13 වර්ගයේ බලවේග කට්ටලය

2018 වසරේ ඉන්දියාවෙන් ගෙන්වා ධාවනයට එක්කල එම්11 වර්ගයේ දුම්රිය එන්ජිම



එමෙන්ම බාහිර පාර්ශවයන් සමග එක්ව ධාවනයෙන් ඉවත් කළ මගී මැදිරි 200 පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ 2018 වසර අවසානය වන විට මැදිරි 52 ක් පුනරුත්ථාපනය කර ධාවනය සඳහා යොදවා ඇත.







තන්ත්‍රි සමාගම මගින් දුම්රිය මැදිරි 200 ක් නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සකසන ලද රුමේනියන් දුම්රිය මැදිරිය හා එස් 8 වර්ගයේ බලවේග කට්ටල් මැදිරිය.

**ඉන්ධන භාවිතය**

දුම්රිය එංජින් හා බලවේග කට්ටල සඳහා පහත පරිදි ඉන්ධන භාවිතා කර ඇත.

| ඉන්ධන වර්ගය | 2017 | 2018 |
|---|---|---|
| ඩීසල් ලීටර් මිලියන | 37.80 | 37.57 |
| ඉන්ධන සඳහා වියදම (රු.මි) | 3,592.0 | 3,858.08 |

වගු අංක 17

2018 වර්ෂයේ ඉන්ධන භාවිතය ලීටර් මිලියන 37.57 ක් වූ අතර ඒ සඳහා රු.මි. 3,858.08 ක පමණ වියදමක් දැරීමට සිදු විය. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ භාවිතා කරන ලද ඉන්ධන ලීටර් මිලියන 0.23 ක ප්‍රමාණයේ අඩුවීමක් හඳුනාගත හැකි අතර එයට බලපාන ලද ප්‍රධානතම සාධක වූයේ මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ වර්ජන හේතුවෙන් හා වෙනත් කාර්මික ආපදා හේතුවෙන් දුම්රිය හා දුම්රිය ගමන්වාර සංඛ්‍යාව අඩුවීමයි. එමෙන්ම සති අන්තයේ ගමනාන්ත දක්වා යොදවන ලද දුම්රියන් නැවත අංගනයන් වෙත ගෙන්වා නොගෙන සතිය ආරම්භයේ මගීන් සමග ගෙන්වා ගැනීමෙන් ඉන්ධන පාරිභෝජනයේ යම් අඩුවීමක් සිදුවී ඇත.

## 7. ස්ථිර මාර්ග පද්ධතිය හා ඉදිකිරීම්

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පීලි අඩි 94,907 ක් ද කොන්ක්‍රීට් සිල්පර 74,593 ක්ද දැව සිල්පර 40,290 ක්ද බැලස්ට් කියුබ් 13,913 ක් ද භාවිතා කෙරිණි.

දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කර ගත් ද්‍රව්‍ය

| යොදා ගත් ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---:|
| රේල් පීලි අඩි | 94,907 |
| දැව සිල්පර | 65,026 |
| වානේ සිල්පර | 3,654 |
| කොන්ක්‍රීට් සිල්පර | 74,593 |
| බැලස්ට් කියුබ් | 13,913 |

වගු අංක 18

පුත්තලම දුම්රිය මාර්ගයේ සීදූව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම් කටයුතු, මහව ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු හා මහනුවර - පේරාදෙණිය - කඩුගන්නාව මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කරන ලදී. තවද අළුත්ගම සිට ගාල්ල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරමින් මැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීම, දුම්රිය ස්ථාන ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු නිම කිරීම, ඔස්ට්‍රියානු රජයේ ණය ආධාර යටතේ නව කැළණි පාළම ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර අදාළ තෝරා ගත් ලංසුකරුවන් වෙත ලියවිලි ලබා දී ඇත.




ඇල්ල දුම්රිය ස්ථානයේ අලුතින් ඉදිකරන ලද පාෂ මාර්ගය ද්විත්වය හා වන මගී වේදිකාව

බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය නවීකරණය කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළ අවසන් කරන ලදී. ඒ තුළ මගී ජනතාවට වඩා යහපත් මෙන්ම කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකියාව ලැබෙන අතර ඉතාමත් ප්‍රියංකර බවකින් යුතු ස්ථානයක් බවට දුම්රිය ස්ථානය පත්වන ලදී.

දුම්රිය මාර්ග නඩත්තු කිරීමේ කටයුතු මෙම වසර පුරාවටම සිදු කරන ලදී. කාර්යක්ෂම කඩිනම් දුම්රිය සේවාවක් සැපයීම සඳහා දැව සිල්පර 65,026, කොන්ක්‍රීට් සිල්පර 74,593, බැලස්ට් කියුබ් 13,913 ඇතිරීම සිදු කරන ලදී. ඒ තුළ වේග සීමා අවම වීමකින් තොරව නියමිත කාලයට ධාවනය වන දුම්රිය සේවාවක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබිණි.

තවද පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ කටයුතු සිදුකර ගෙන යනු ලබන අතර මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදි. එමෙන්ම පුත්තලම් දුම්රිය මාර්ගයේ සීදූව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද අතර ආසියානු සංවර්ධන බැංකුවේ

ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය සේවා වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත.

කැළණිය, ඇල්ල, පන්නිපිටිය, වැල්ලවත්ත, මරදාන, උතුරු කළුතර, ගනේවත්ත, මුත්තේට්ටුගල, කන්තලේ, කැකිරාව, විල්වත්ත, නුගේගොඩ යන දුම්රිය ස්ථානයන්හි වේදිකා ඉස්සීම හා දිගු කිරීම මෙම වසර තුළ සිදු කර අවසන් කරන ලදී. ඊට සමගාමීව ඇල්ල, කොස්ගොඩ, කහව, වැල්ලව, ගනේගොඩ, තල්පේ යන දුම්රිය ස්ථානයන්හි ගුවන් පාලම් ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී.



**වැල්ලව දුම්රිය ස්ථානයේ අලුතින් ඉදිකරන ලද දුම්රිය ස්ථාන වේදිකා හා ගුවන් පාලම**

තවද 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද නව ඉදි කිරීම් හා ගොඩනැගිලි සංවර්ධන කටයුතු පිලිබඳ විස්තරයක් පහත වගු අංක 18 න් දැක්වේ.

| | සංවර්ධන කාර්යය | නිම කළ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වානේ පාළම් පුනරුත්ථාපනය කිරීම | 06 |
| 02 | මගී පාළම් ඉදිකිරීම | 05 |
| 03 | රත්මලාන ප්‍ර.ඉ.ධා කාර්යාලය සුළු අලුත්වැඩියා කිරීම | 01 |
| 04 | ස්ථිර මාර්ග පරීක්ෂක නිල නිවාස | 02 |
| 05 | දුම්රිය ස්ථානාධිපති නිල නිවාස | 05 |
| 06 | සේවක නිල නිවාස | 04 |
| | **එකතුව** | **23** |

**වගු අංක 19**

2017 වර්ෂයේදී ඉවත් කරන ලද වේග සීමා පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| අංකය | මාර්ගය | ඉවත් කළ වේග සීමා |
|---|---|---|
| 01 | මධ්‍යම දිස්ත්‍රික්කය | 21 |
| 02 | පහළ දිස්ත්‍රික්කය | 11 |
| 03 | ඉහළ දිස්ත්‍රික්කය | 17 |
| 04 | උතුරු දිස්ත්‍රික්කය | 38 |
| 05 | නැගෙනහිර දිස්ත්‍රික්කය | 53 |
| | **එකතුව** | **140** |

**වගු අංක 20**

2018 වර්ෂයේ වේග සීමා 140 ක් පමණ ඉවත් කිරීමට හැකි වී ඇත. මෙම තත්වය ඉතාමත් යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. වේග සීමා ඉවත් කිරීම තුළින් ස්ථාවර වේගයක් යටතේ දුම්රියට ගමන් කිරීමට හැකිවීම තුළින් නියමිත වේලාවට දුම්රිය ගමනාන්තය දක්වා ලඟා වීමට හැකියාව ලැබේ. ඒ තුළ වඩා කාර්යක්ෂමවත් දුම්රිය ප්‍රවාහන සේවාවක් මඟී ජනතාව වෙත ලබා දීමට හැකියාව ලැබේ.

## 8. සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

ආරක්ෂාකාරී හා කාර්යක්ෂම දුම්රිය සේවයක් පවත්වා ගැනීම සඳහා දුම්රිය සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වේ. කි.මී. 1450ක් පමණ වන ශ්‍රී ලංකාවේ දැනට පවතින දුම්රිය මාර්ග පද්ධතිය පුරා පිහිටා ඇති දුම්රිය ස්ථාන 175ක් පමණ වන අතර, එම සියලු දුම්රිය ස්ථාන සඳහා පිහිටුවා ඇති සංඥා පද්ධති නිසි ලෙස නඩත්තු කර යථා ක්‍රියාකාරී මට්ටමකින් පවත්වා ගැනීම සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යභාරයකි. එමෙන්ම මේ වන විට දුම්රිය මාර්ග පද්ධතිය පුරා පිහිටුවා ඇති ක්‍රියාකාරී දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති සංඛ්‍යාව 500කට අධික වන අතර ඒවාද නිසි ලෙස නඩත්තු කර නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවත්වා ගෙන යනු ලැබේ.

සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ මනා නඩත්තුව හා නවීකරණ කටයුතු දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මනා පිටිවහලක් සපයයි. පෙර වසර වලදී මෙන්ම 2018 වර්ෂය තුළදී ද සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව දැඩි කැප වීමකින් අඛණ්ඩව නඩත්තු කටයුතු සිදුකර ඇත.

සංඥා පද්ධතියේ එදිනෙදා නඩත්තු කටයුතු වලට අමතර වශයෙන් පහත පරිදි නවීකරණ කටයුතු සිදු කිරීමටද 2018 වර්ෂය තුළදී මූලිකත්වය දීම මඟින් දුම්රිය සේවයේ ඵලදායිතාව ඉහළ නැංවීමට සමත් වී ඇත.

2017 වසරේදී ඉදිකිරීම් කටයුතු නිම කරන ලද සීදූව - කටුනායක ද්විත්ව දුම්රිය මාර්ගය සඳහා කාර්යක්ෂම හා ඵලදායි ලෙස දුම්රිය ධාවනය කිරීම සඳහා සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කෙරිණ. මෙහිදී දුම්රිය ගමනාගමනය අතරතුරදී එම ධාවනයන්ට සිදුවන බාධාවන් අවම වන පරිදි නිසි සැලසුමකින් යුක්තව දැඩි පරිශ්‍රමයක් දරමින් පෙර ව්‍යාපෘතින්ට සාපේක්ෂව අඩු කාල සීමාවක් තුළදී සංඥා පද්ධතියේ වැඩ කටයුතු නිම කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලැබූ විශිෂ්ඨ ජයග්‍රහනයකි. සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ නිර්මාණශීලී දායකත්වය මෙමගින් මනාව පිළිබිඹු වේ.



කටුනායක දුම්රිය ස්ථානයේ ද්විත්ව මාර්ගය සඳහා සීදුව දෙසට පිහිට වූ පිටත්වීමේ සංඥා

2018 වර්ෂයේදී ඉදිරිපත් වූ යෝජනාවකට අනුව පොල්ගහවෙල සිට මහව දක්වා වන සියලුම දුම්රිය අංගන සහ ඒ හා අනුබද්ධිත සියලු සංඥා පද්ධති වර්ණ සංඥා පද්ධති බවට පත් කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කරමින් පොතුහැර පොල්ගහවෙල අතර දුම්රිය කොට්ඨාශයේ පහත අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා විදුලි සීනු දුම්රිය හරස්මාර්ග අනතුරු ඇඟවීම් පද්ධති සවි කිරීමද 2018 වර්ෂයේදී සිදු කෙරිණ.

1. වාගොල්ල කදුරුකුඹුර මාර්ගය
2. නයිලිය පහළගම වෙලමැද දුම්රිය හරස් මාර්ගය
3. නයිලිය දුම්රිය ස්ථානය අසල දුම්රිය හරස් මාර්ගය







නයිලිය දුම්රිය ස්ථානය අසල දුම්රිය හරස් මාර්ගය සඳහා පිහිටවූ විදුලි සීනු අනතුරු ඇඟවීම් සංඥා පද්ධතිය

තවද කටුනායක සීදුව ද්විත්ව මාර්ග සංඥා පද්ධතිය ලබා දීමේදී හා අනෙකුත් අංශවල පහත පරිදි හරස් මාර්ග සංඥා පද්ධති සවිකිරීම හා නවීකරණය කිරීමද සිදුවිය.

1. කටුනායක පන්සල පාර
2. කටුනායක දුම්රියපොල පාර
3. නුගගහ පාර
4. කටුනායක නායක පාර
5. ලියනගේමුල්ල පල්ලිය පාර
6. තලවත්තේගෙදර දුම්රිය හරස් මාර්ගය
7. වාද්දුව බෝධිරාජ මාවත
8. කටුකුරුන්ද හරස් මාර්ගය
9. පැල්පොලවත්ත දුම්රිය හරස් මාර්ගය
10. සමගි මාවත

හඳුනාගත් දුම්රිය හරස් මාර්ග සඳහා දුම්රිය පැමිණීම දර්ශනය වන පරිදි දර්පණ සවි කිරීමටද මේ වසරේදී විශේෂ අවධානයක් යොමුවිණි.

උද්‍යසන රාජකාරී දුම්රිය තදබදය අවම කිරීම සඳහා මරදාන සිට රාගම දක්වා ඉහළ මාර්ගයේ පහළ දිශාවට බ්ලොක් කොට්ඨාශ හඳුන්වා දී නව බ්ලොක් සංඥා පද්ධතිය පිහිටුවා ධාවනය සඳහා ලබාදීමද 2018 වර්ෂය තුළදී සිදුකරන ලද සංඥා පද්ධති නවීකරණයේ තවත් සුවිශේෂී පියවරකි.

හඳුනාගත් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200ක් සඳහා විදුලි සීනු සංඥා ආරක්ෂණ පද්ධති පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී හරස් මාර්ග 85ක් සම්පූර්ණයෙන් නිම කිරීමට හැකිවී ඇත.

මේ අයුරින් වර්ෂ 2018 යනු සංඥා පද්ධතියේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පියවර රැසක් අනුගමනය කල වසරක් බව සැලකිය හැක.

## 9. ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

ගුණාත්මක කාර්මික ශිල්පීන් බිහි කිරීමේ අරමුණෙන් පවත්වාගෙන යනු ලබන ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය සිය කාර්යභාරය 2018 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. පුහුණුව ලබන සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, වෘත්තීය පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ පුහුණු වන ආධුනිකයන්ගේ ඇගයීම් කටයුතු සිදු කිරීම, විශ්ව විද්‍යාල සිසුන්ගේ වැඩ බිම් පුහුණු අධීක්ෂණ කටයුතු සිදු කිරීම ආදී කාර්යයන් මෙමඟින් සිදු කොට ඇත.

මෙම ආයතනය මඟින් කරගෙන යනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක කරන ලදි. ජාතික වෘත්තීය සුදුසුකම් National Vocational Qualification තත්වයන් ඇතුළත් පූර්ණකාලීන පාඨමාලා මේ යටතේ පවත්වාගෙන යනු ලබයි.

ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මඟින් 2018 වර්ෂයේදී පවත්වා ගෙන යන පාඨමාලා හා පුහුණුව ලබන හා පිටව ගිය සංඛ්‍යාව

| අංකය | පාඨමාලාව | පුහුණුව ලබන සංඛ්‍යාව | පිට වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | 29 | - |
| 03 | යන්ත්‍රකරු | 20 | - |
| 04 | විදුලි ශිල්පී | 29 | - |
| 05 | පෑස්සුම්කරු | 21 | - |
| | **එකතුව** | **99** | **-** |

වගු අංක 21

2018 වර්ෂයේදී සිසුන් 99 දෙනෙකු පුහුණුව ලැබූ අතර මේ වසරේදී පාඨමාලා අවසන්කර පිටව ගොස් නොමැත.

ඒ ඒ ආයතන සඳහා කර්මාන්ත ගත පුහුණුව ලබා දේ එය අංක 22 වගුවෙන් දැක්වේ.

| | ආයතනය | සිසුන් ගනන |
|---|---|---|
| 1 | HNDE | 05 |
| 2 | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 04 |
| 3 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය | 33 |
| 4 | NDT | 03 |
| 5 | විවෘත විශ්වවිද්‍යාලය | 10 |
| 6 | SLIIT | 05 |
| 7 | CINEC | 02 |
| 8 | UNIVERSITY COLLEGE | 01 |
| 9 | UNIVOTEC | 02 |
| 10 | කාර්මික විද්‍යාලය | 13 |
| | **එකතුව** | **78** |

වගු අංක 22

## 10. දුම්රිය ආරක්ෂක සේවය

දුම්රිය ආරක්ෂක සේවය 2018 වර්ෂයේ ද විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. එය පහත සදහන් පරිදි හදුනාගත හැකිය.

- දුම්රිය ආරක්ෂක නිලධාරීන් යොදවා සතියකට දුම්රිය 350 කට ආසන්න සංඛ්‍යාවක් රැකවරණය කරනු ලබයි. ඊට අමතරව දෛනික නිලධාරීන්/නිලධාරිණියන් 150 කට අධික සංඛ්‍යාවක් සිවිල් ඇඳුමින් කාර්යාල දුම්රිය වලට යොදවනු ඇත.
- නිලධාරීන් කණ්ඩායම් වශයෙන් යොදවා ජනාධික දුම්රිය ස්ථාන වල විශේෂ ප්‍රවේශ පත්‍ර පරීක්ෂාවක් සිදු කර විශාල ආදායමක් දෙපාර්තමේන්තුවට උපයා දී ඇත.

- දුම්රිය ආරක්ෂක නිලධාරීන් සිවිල් ඇඳුමින් යොදවා දුම්රිය මඟීන්ට හිරිහැරයක් වී ඇති යාචකයින් හා අනවසර වෙළඳාමේ යෙදෙන පුද්ගලයින් අත්අඩංගුවට ගැනිමට කටයුතු කර ඇත.

- රැකවරණ රාජකාරීන්හි නිරත වන ආරක්ෂක නිලධාරීන්ට පැති අවි නිකුත් කර දුම්රිය වල රාජකාරි යෙදවීමට පියවර ගෙන ඇත.

- කොළඹ කොටුව- කන්කසන්තුරේ, කොළඹ කොටුව - බදුල්ල, කොළඹ කොටුව-මඩකලපුව, කොළඹ කොටුව-ත්‍රිකුණාමලය, කොළඹ කොටුව-තලෙයිමන්නාරම හා කොළඹ කොටුව - මහනුවර වැනි දුම්රිය ගමනාන්තය දක්වා දුම්රිය රැකවරණායන් සිදු කරනු ලබයි.

- දෙපාර්තමේන්තු දේපල වලට මෙන්ම දුම්රිය මඟීන්ට ආරක්ෂාව සැලසිම.

- කොළඹ සහ පේරාදෙණිය යන ස්ථානවල විශේෂ අපරාධ ඒකකය මඟින් පිහිටුවා දණ්ඩ නීති සංග්‍රහය යටතේ සැකකරුවන් 32 ක් පමණ අත්අඩංගුවට ගෙන ඇත. (ඒ අතර රන්මාල කඩා ගැනීම්, මුදල් පසුම්බි සොරා ගැනීම්, ලැප් ටොප් යන්ත්‍ර සොරා ගැනීම් හා ජංගම දුරකතන සොරා ගැනීම්)

- 2018 වසර සඳහා අනවසර වෙළඳුන් 195 ක් අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඇත.

- 2018 වසරේ යාචකයින් 24 දෙනෙකු අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඇත.

- 2018 වසරේ දුම්රිය හරස් මාර්ග සංඥා නොතකා ගමන් කල පුද්ගලයින් 221 දෙනෙකු අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඇත.

- 2018 වර්ෂය සඳහා ප්‍රවේශ පත්‍ර වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව 2713 ක් වන අතර රුපියල් 8,304,249.00 මුදලක් දඩ වශයෙන් අය කර ඇත.

2018 වසර ප්‍රගතිය පහත වගු අංක 23 මඟින් දැක්වේ.

| | 2017 | | 2018 | | 2018 ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| **ක්‍රියාත්මක කළ කාර්යය** | **ප්‍රමානය** | **දඩ මුදල** | **ප්‍රමානය** | **දඩ මුදල** | **ප්‍රමානය** | **දඩ මුදල** |
| ප්‍ර.නොමැතිව | 1333 | 4,153,562.00 | 2248 | 6,820,483.00 | 915 | 2,666,918.00 |
| ඉහළ පංතිය ගමන් කිරිම | 295 | 912,992.00 | 465 | 1,483,766.00 | 170 | 570,774.00 |
| අධිබර | 60 | 17,500.00 | 164 | 46,432.00 | 104 | 28932.00 |
| අනවසර වෙළඳුන් | 141 | 154,420.00 | 195 | 188,850.00 | 54 | 34,430.00 |
| දුම්රිය හරස් මාර්ග සංඥා නොතකා ගමන් කිරිම් | 134 | 154,950.00 | 221 | 247,500.00 | 67 | 92,550.00 |
| යාචකයින් | 7 | අවවාද | 24 | 5,100.00 | 17 | 5,100.00 |

වගු අංක 23

## 11. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ගත් පියවර

- ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය එන්ජින් 10 ක් සහ බලවේග කට්ටල 06 ක් මිල දී ගැනීම යටතේ පළමු බලවේග කට්ටලය හා එන්ජිම මෙම වසර අවසානයේ ගෙන එන ලදී.
- ඉන්දියානු ණය ආධාර යටතේ මගී මැදිරි 160 ක් තෙල් ටැංකි 30 ක් හා කන්ටේනර් ප්ලැට් 20 ක් මිල දී ගැනීම.
- කැළණිවැලි දුම්රිය මාර්ගය හා දුම්රිය ස්ථාන වැඩිදියුණු කර අවසන් කිරීම
- Bell & Light දුම්රිය හරස් මාර්ග පද්ධති 200 ක් ස්ථාපිත කිරීම
- දුම්රිය ස්ථානාධිපතිවරුන්, නියාමකවරුන් බඳවා ගැනීම හා ඒ තුළින් දුම්රිය සේවය කාර්යක්ෂම කිරීම
- ප්‍රවේශ පත්‍ර නොමැතිව ගමන් කරන මගීන් වැටලීමේ කටයුතු හා දඩ මුදල් අය කිරීමේ කටයුතු
- දුම්රිය ස්ථානයන්හි හා මගීන්ගේ ආරක්ෂක කටයුතු විධිමත්ව හා තව දුරටත් පුළුල් කරමින් ක්‍රියාත්මක කිරීම
- දුම්රිය ස්ථානයන්හි හා දුම්රියන්හි ජංගම වෙළදාම් කටයුතු සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩසටහන යටතේ ස්වයං රැකියාලාභීන් යෙදවීමෙන් විධිමත් ආකාරයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- බෙල්ජියම් මූල්‍ය ආධාර මත මාර්ග ජාලයේ ඉදි කිරීම් සඳහා පාළම් 02 ක් ඉදි කිරීම
- දුම්රිය මාර්ග ජාලය, දුම්රිය ඇණිය, සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ නඩත්තු කටයුතු අඛණ්ඩව හා විධිමත්ව ක්‍රියාත්මක කිරීම
- දුම්රිය රක්ෂිත වලින් ආදායම් එකතු කිරීම කාර්යක්ෂම කිරීම සඳහා බදු ලබා දුන් දුම්රිය රක්ෂිත සඳහා පරීක්ෂණක වැඩ සටහනක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
- ප්‍රධාන දුම්රිය ස්ථාන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම
- මගී මැදිරි 200 ක් පුණරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා මෙම වසර අවසානය වන විට මැදිරි 52 ක් පුනරුත්ථාපනය කර ප්‍රවාහන කටයුතු සදහා යොදාග ැනීම
- දුම්රිය එන්ජින් 03 ක් හා බලවේග කට්ටලයක් පුනරුත්ථාපනය කිරීම
- පොල්ගහවෙල කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ගය සකස් කිරීම
- පයාගල හා අළුත්ගම යන දුම්රිය ස්ථාන අතර ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය මැනීම් කටයුතු සිදු කිරීම
- නව දුම්රිය ගමන්වාර හදුන්වාදීම
- සීදුව සිට කටුනායක දක්වා නව සංඥා පද්ධතිය ස්ථාපිත කර අවසන් කිරීම

# 12. අභියෝගයන් සහ ගැටලු

දුම්රිය දෙපාර්තමේන්තුවද ආදායම් ලබමින් මහ භාණ්ඩාගාරයෙන් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන සඳහා යම් ආදායම් තත්වයක් ලබා ගැනීම වර්තමානයේ පවතින අභියෝගයන් අතර ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පහත දැක්වෙන විසදා ගත යුතු ප්‍රධාන අභියෝගයන් කීපයක් හඳුනා ගෙන ඇත.

01 පුනරාවර්ථන වියදම් වල පුද්ගලික පඩිනඩි හා ඉන්ධන වියදම් ඉහළ මට්ටමක පැවතීම සිදු වන නිසා ආදායම හා පුනරාවර්ථන වියදම අතර ඇති පරතරය අඛණ්ඩව පැවතීම.

02 දුම්රිය ප්‍රාග්ධන කාර්යයන් සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වන බැවින් ඒ සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. එම නිසා නව ව්‍යාපෘති විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කිරීමට සිදු වේ. විශේෂයෙන් දුම්රිය ඇණිය මිල දී ගැනීමේ කටයුතු දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආදිය සඳහා මෙම ණය ආධාර යෙදවේ. තවද මේ යටතේ වන මිල දී ගැනීම් ආදිය සඳහා දීර්ඝ කාලයක් ගතවන අතර මෙය ප්‍රධාන ගැටලුකරි තත්වයකි..

03 ධාවනය වන දුම්රිය එංජින් වලින් 65 % ක් පමණ වසර 30 ඉක්ම වූ දුම්රිය එංජින් තිබෙන බැවින් මේවා නඩත්තුව සඳහා අමතර කොටස් මිල දී ගැනීමට වැඩි පිරිවැයක් හා කාලයක් ගත වීම.

04 දුම්රිය රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් නිසා ඉදිරි දුම්රිය සංවර්ධන කටයුතු සඳහා මතු වන බාධා

05 මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දීර්ඝ ක්‍රියාත්මක වීම්

06 දුම්රිය මාර්ග ඉදි කිරීම් දුම්රිය ඇණිය මිල දී ගැනීම් හා සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ ස්ථාපිත කිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා වන තාක්ෂණික කරුණු අවසන් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම

07 පැරණි දුම්රිය මැදිරි ධාවනයට යෙදවීමට සිදු වී ඇති බැවින් ඒවා අලුත්වැඩියා කිරීමට වැඩි කාලයක් ගතවීම

ඉහත අභියෝගයන්ට අමතරව පහත සඳහන් අභියෝගයන්ද දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් හඳුනා ගෙන ඇත.

- **තොරතුරු තාක්ෂණය**

තොරතුරු තාක්ෂණය ක්‍රමවේදයන් හා පරිචයන් වෙත අනුගත කර ගැනීම හා ඒවා භාවිතයට යොමු කිරීම අභියෝගාත්මක කරුණක් වන අතර මේ සදහා මානව හා භෞතික සම්පත් වල පවතින හිගය, සේවක ආකල්ප ආදියද බලපානු ලැබේ. තත්වය එසේ වුවද ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම, ආසන වෙන් කිරීම, දුම්රිය මෙහෙයුම් කටයුතු, ඉඩම්, දේපල, වත්කම් කළමනාකරණය, මිල දී ගැනීම් ක්‍රියාවලිය, තොග පාලන කටයුතු ආදී කාර්යයන් සඳහා තොරතුරු තාක්ෂණ (IT) ක්‍රමවේදය භාවිතා කිරීම කාර්යක්ෂම හා ජාත්‍යන්තරයට ගැලපෙන දුම්රිය සේවාවක් සඳහා ප්‍රවේශයක් වනු ඇත.

■ **පාරිසරික අභියෝගයන්**

ස්වභාවික හා පාරිසරික අභියෝගයන් ලෙස නාය යෑම්, ජල ගැලීම් වැනි හේතූන් නිසා දුම්රිය මාර්ග යට හා සංඥා පද්ධතියට බලපෑම් එල්ල වන අතර මේ හේතුවෙන් දුම්රිය ධාවනයන් අවලංගු කිරීමට හා ප්‍රමාද කිරීමට සිදු වේ. මෙවැනි ස්වභාවික ආපදාවන් සඳහා මුහුණ දීමට මානව හා භෞතික සම්පත් පෙර සූදානමක් සහිතව ස්ථානගත කොට හෝ හදිසි අවස්ථාවකදී ලබා ගැනීමේ හැකියාවකින් යුක්ත වීම වැදගත් වන අතර පවතින සේවක හා වෙනත් භෞතික සම්පත් වල පවතින හිඟය හමුවේ මෙය එතරම් පහසු කාර්යයක් නොවනු ඇත.

■ **සේවක හිඟය**

දෛනික සේවා පවත්වා ගෙන යෑමේදී සියලුම අංශ වල පවතින කාර්ය මණ්ඩල හිඟය නිසා අදාළ කටයුතු වලදී ගැටලුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වේ.

තවද සමස්ථයක් ලෙස ගත් කළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවක සංඛ්‍යාවෙන් ඉතා විශාල සංඛ්‍යාවක් විශ්‍රාම යෑමෙන් හෝ වෙනත් හේතූන් මත ඉවත් වේ.

තවද මෙම අවශ්‍ය අංශ වල පවතින සේවක පුරප්පාඩු නිසා ඒවායේ අත්‍යාවශ්‍ය සේවා (දුම්රිය නඩත්තු, අලුත්වැඩියා, සාමාන්‍ය පරිපාලන කටයුතු, මෙහෙයුම් කටයුතු, මාර්ග නඩත්තු, සංඥා පද්ධතිය නඩත්තු හා අලුත්වැඩියා ආදිය) පවත්වා ගෙන යෑම සදහා වැය වන අතිකාල දීමනාද වාර්ෂිකව ඉතා ඉහළ අගයක පවතී.

## 13. 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

| අංකය | ප්‍රධාන ප්‍රාග්ධන කාර්යය | වැය වූ මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | දුම්රිය ඇණිය සඳහා කරනු ලැබූ සුළු අලුත්වැඩියාවන් | 784.01 |
| 02 | දුම්රිය ඇණිය සඳහා කරනු ලැබූ ප්‍රධාන අලුත්වැඩියාවන් | 2,441.09 |
| 03 | එංජින් පුනරුත්ථාපනය හා අමතර කොටස් මිල දී ගැනීම | 119.98 |
| 04 | දුම්රිය මාර්ගය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම | 2,410.94 |
| 05 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 144.23 |
| 06 | දුම්රිය ස්ථාන හා ගොඩනැගිලි සංවර්ධනය කිරීම | 199.08 |
| 07 | කොන්ක්‍රීට් සිල්පර මිල දී ගැනීම | 194.93 |
| 08 | දුම්රිය මැදිරි පුනරුත්ථාපනය කිරීම | 617.95 |
| 09 | ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ස්ථාපිත කිරීම | 464.51 |
| 10 | සංඥා හා විදුලි සංදේශ පද්ධතිය නඩත්තුව හා වැඩිදියුණු කිරීම | 227.46 |

වගු අංක 24

## 14. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති

දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්ම අනුව දුම්රිය ප්‍රවාහන කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් පවතින ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන නව දුම්රිය සංවර්ධන ව්‍යාපෘති කීපයක් පහත දැක්වේ.

01. වේයන්ගොඩ - පානදුර දක්වා දුම්රිය මාර්ගය විදුලිකරණය කිරීම

02. මහව - ඕමන්තේ දුම්රිය මාර්ගය නවීකරණය කිරීම

03. කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය ඉදි කිරීම

04. පේරාදෙණිය - මහනුවර දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම

05. පොල්ගහවෙල -කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම

06. පේරාදෙණිය - ගම්පොළ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම

07. පේරාදෙණිය - කඩුගන්නාව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම

08. පැරණි කැළණි පාළම වෙනුවට නව පාළමක් ස්ථාපිත කිරීම

09. දුම්රිය ඇණිය වැඩිදියුණු කිරීම සහ වර්ධනය කිරීම. මේ යටතේ එංජින් බලවේග කට්ටල, මගී මැදිරි, තෙල් ටැංකි හා කන්ටේනර් ප්ලැට් වැගන් මිල දී ගැනීම

10. ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ස්ථාපිත කිරීම

11. මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම

12. කර්මාන්ත ශාලා, සහ ධාවනාගාර සහ අංගන පහසුකම් වැඩිදියුණු කිරීම

13. දුම්රිය එන්ජින් පුනරුත්ථාපනය කිරීම

14. කැළණිවැලි දුම්රිය මාර්ගය නවීකරණය කිරීම

15. ඉලෙක්ට්‍රොනික් ප්‍රවේශපත්‍ර පද්ධතියක් ස්ථාපිත කිරීම

16. නව සංඥා පද්ධති 200 ක් ස්ථාපිත කිරීම